# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම
# 2012 නොවැම්බර් මස 06 වන දින  පෙ.ව 9.30ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිතුමාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්විම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

**01. ගරු උදේන විජේරත්න මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට :**

(ප්‍ර/V (1)12/24)

අ. මීරිගම බණ්ඩරනායක මහා විදුහල, මීරිගම ආදර්ශ කණිෂ්ඨ විදුහල,පස්යාල ප්‍රාථමික විදුහල, පල්ලේවල මහ විදුහල යන විදුහල්වල පළමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීමේදී විවධ අක්‍රමිකතා සිදුවන බව ඔබතුමා දන්නේද?

ආ. පවතින ක්‍රමය අනුව ඇතුළත් කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් වැඩිම ලකුණු ලබා ගන්නා ළමුන් 33 දෙනෙක්, අභියාචනා වලින් ළමුන් දෙදෙනෙක් හා ක්‍රියාන්විත රාජකාරියේ යෙදෙන අයවලුන්ගේ ළමුන් 07 දෙනෙක් වශයෙන් ළමුන් 42ක් ඇතුළත් කරගන්නා බව ඔබතුමා දන්නේද?

ඇ. පන්තියක ළමුන් 45 දක්වා ඇතුළත් කිරීමේදී ඉතිරි තිදෙනා සහ මූලිකව තෝරාගත් ළමුන්ගේ අඩුවක් වුවහොත් එම සංඛ්‍යාව ඇතුළත් කරනුයේ සම්මුඛ පරීක්ෂණයේ වැඩි ලකුණු ලබා ගත් පදනම යටතේද? නොඑසේ නම් වෙනත් ක්‍රමවේදයක් හරහාද?

ඈ. වැඩි ලකුණු ලබා ගත් පදනමින් බැහැරව කටයුතු කරන්නේ නම් එයින් ළමුන්ට අසාධාරණයක් වන බව ඔබ තුමා පිළිගන්නේද ?

ඉ. මෙවැනි අසාධාරණයක් වැළැක්වීමට ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

ඊ. ඉහත කී විදුහල්වල 2013 වසරට ඇතුළත් කර ගැනීමට සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වූ ළමුන්ගේ නාම ලේඛණයක් ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමාණයන් හා ඇතුලත් කිරීමට පදනම් කරගත් ලකුණු ප්‍රමාණයන් සභාගත කරන්නේද?

**02. ගරු ශූ.ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්කෘතික හා කලා කටයුතු සමූපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට:**

(ප්‍ර/V (1)12/25)

අ. පළාත් සභා සමූපකාර අමාත්‍යාංශය යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ පවතින සණස සමිති ප්‍රමාණය කොපමණද? එම සංගම් නම් වශයෙන් වෙන වෙනම සඳහන් කරන්නේද?

ආ. එම සංගම් වල තනතුරු සඳහා පත්කිරීමට බලය ඇත්තේ කාහටද ?

ඇ. සණස සමිති අතුරින් මහර ආසනයේ වැබඩ උතුර බටහිර සණස සංවර්ධන බැංකුවේ මූල්‍ය වත්කම් ප්‍රමාණය කොපමණදැයි සඳහන් කළ හැකිද? එකී වත්කම් පිළිබඳ විගණනයක් කර ඇත්තේද? ඒ කිනම් වර්ෂයේද ?

ඈ. එම මුදල් තැන්පත් කරුවන්ට තැන්පතු සඳහා නිසි සුරක්ෂිතභාවයක් තිබේද ?

ඉ. තැන්පත්කරුවන්ට මුදල් ආපසු ලබා ගැනීමට අයදුම්කල විට මුදල් ලබාගැනීමට දින ගණන් ගතවන බව ඔබතුමා දන්නෙහිද ?

ඊ. මේ පිළිබඳව කඩිනම් පරීක්ෂණයක් සිදුකර මෙම අපහසුතාවය මඟහැරවීමට පියවර ගන්නවාද? නොඑසේනම් මන්ද ?

උ. මෙයට පිළිතුරු සභාගත කරන්නේද ? නොඑසේනම් මන්ද ?

**03. ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්කෘතික හා කලා කටයුතු සමූපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට:**

(ප්‍ර/V (1)12/26)

අ. සී/ස පිළියන්දල බෝකුන්දර සමූපකාර සමිතියේ මහා සභා කාලය 2010.05.21 වන දින අවසන් වූ අතර, පසුගිය වසර දෙක තුල ඡන්ද විමසීමක් පැවැත්වීමට කොමසාරිස්තුමා අසමත් වී ඇති බැවින් ඒ සම්බන්ධව ඔබතුමා ගන්නා පියවර කුමක්ද ?

ආ. ප්‍රඥප්තියේ 60 වන වගන්තියේ 35 "අ" අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කල යුත්තේ රාජ්‍ය නිලධාරීන් වන අතර, දැනට කොමසාරිස්තුමා විසින් පත් කර ඇති හිටපු සභාපති නන්දලාල් ජයසුන්දර මහතා හා ඒ.ඒ.ඩී සුනිල් යන අය දැරූ රාජ්‍ය තනතුරු මොනවාද ? කාල වකවානු කවරේද ?

ඇ. ඉහත නම් සඳහන් අධ්‍යක්ෂකවරුන් නගරයේ ව්‍යාපාරිකයින් වන අතර, මොවුන් පත් කිරීම නීති විරෝධී බව ඔබතුමා දන්නේද? එසේ නම් එම නිලධාරීන් සම්බන්ධයෙන් ගන්නා පියවර කුමක්ද?

ඈ. මෙම සමූපකාර සමිතියේ අධ්‍යක්ෂක මණ්ඩලයට විරුද්ධව ඉදිරිපත්කර ඇති චෝදනා සම්බන්ධයෙන් ගරු ගාමිණී ලොකුගේ අමාත්‍යතුමා සහ ගරු පළාත් ප්‍රධාන අමාත්‍යතුමා මේ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වන ලෙස දන්වා ඇති අතර, ඒ සම්බන්ධයෙන් ගත් පියවර කවරේද?

ඉ. ඔබතුමා විසින් නිපුණතා ඇති රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු පත් කළ පසු නැවතත් ඡන්ද විමසීමක් පවත්වන්නේ කවදාද ?

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

IX. ශෝක ප්‍රකාශ යෝජනා

**01. හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී කේ.ඒ ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කිරීමේ යෝජනාව**

“ බස්නාහිර පළාතේ පළාත් සභාවේ දෙවන පළාත් සභාවට පොදුජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්ව වසර හතරක (04) පමණ කාලයක් බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කරන ලද, හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී කේ.ඒ ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.

බස්නාහිර පළාතේ පළාත් සභාව, එතුමාගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමාගේ වියෝව පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පල කර සිටියි. ”

(ඉදිරිපත් කිරීම - ගරු සභානායකතුමා විසින්)

**02. හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී ඩබ්ලිව්.කේ විජේසිරි මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කිරීමේ යෝජනාව**

“ බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රථම පළාත් සභාවට එක්සත් සමාජවාදී පෙරමුණ නියෝජනය කරමින්ද දෙවන හා තෙවන පළාත් සභාවන්ට පොදුජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින්ද කළුතර පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්ව වසර දොළහක (12) පමණ කාලයක් බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කරන ලද, හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී ඩබ්.කේ විජේසිරි මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.

බස්නාහිර පළාතේ පළාත් සභාව, එතුමාගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමාගේ වියෝව පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පල කර සිටියි. ”

(ඉදිරිපත් කිරීම - ගරු සභානායකතුමා විසින්)

## X. පොදු කටයුතු

**01. ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප)**

**බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා**
**සභාපති, උප සභාපති හා සභිකවරුන්ට අදාල**
**<u>කාරක සභා සහභාගිත්ව දීමනා සඳහා රීති</u>**

1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 184 (1) උපවගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1769/4 හා 2012.07.30 දරන ගැසට් පත්‍රයේ පළකරන්නට යෙදී ඇති " **ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති හා සභිකවරුන්ට අදාල කාරක සභා සහභාගිත්ව දීමනා සඳහා රීති** " ඉහත කී 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 184 (2) උපවගන්තියේ සඳහන් විධිවිධාන අනුව අනුමැතිය සඳහා මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරමි.

**02. ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප)**

**බස්නාහිර පළාතේ නගර සභා**
**සභාපති, උප සභාපති හා සභිකවරුන්ට අදාල**
**<u>කාරක සභා සහභාගිත්ව දීමනා සඳහා රීති</u>**

1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 193 (1) (උඋ) උපවගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1769/4 හා 2012.07.30 දරන ගැසට් පත්‍රයේ පළකරන්නට යෙදී ඇති, " **නගර සභා සභාපති, උප සභාපති හා සභිකවරුන්ට අදාල කාරක සභා සහභාගිත්ව දීමනා සඳහා රීති** " ඉහත කී 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය

සමඟ කියවිය යුතු 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 194 වගන්තියේ සඳහන් විධිවිධාන අනුව අනුමත කළ යුතු යැයි ඉල්ලමින් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කරමි.

**03. ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප)**

**බස්නාහිර පළාතේ මහ නගර සභා**
**නගරාධිපති, උප නගරාධිපති හා සභිකවරුන්ට අදාල**
**ස්ථාවර කමිටු සහභාගිත්ව දීමනා සඳහා නියෝග**

1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු මහ නගර සභා ආඥා පනතේ 289 වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1769/4 හා 2012.07.30 දරන ගැසට් පත්‍රයේ පලකරන්නට යෙදී ඇති **" මහ නගර සභා නගරාධිපති, උප නගරාධිපති හා සභිකවරුන්ට අදාල ස්ථාවර කමිටු සහභාගිත්ව දීමනා සඳහා නියෝග "** ඉහත කී 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු මහ නගර සභා ආඥා පනතේ 289 වැනි වගන්තියේම වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව අනුමැතිය සඳහා මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කරමි.

## XI. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව

2012.10.24
සභා ලේකම් කාර්යාලය (බ.ප)
බස්නාහිර පළාතේ පළාත් සභාව.
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

File Name :- C:\Users\ishani maddumage\Documents\Office\Council\Agenda - 2012.10.24 docx